# භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව 2022

## කැලණිය විශ්වවිද්‍යාලය
## මානවශාස්ත්‍ර පීඨය - වාග්විද්‍යා අංශය

*ඉහත සඳහන් පාඨමාලාව සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කර ගැනීම පිණිස 2022. 05. 22 සිට 2022. 06. 24 දින තෙක් සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගැනීම සිදු කෙරේ.

*මෙම පාඨමාලාව භාෂා පරිවර්තනය සහ භාෂණ පරිවර්තනය පිළිබඳව සෛද්ධාන්තික දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමට සුදුසු වන පරිදි සකස් කර ඇත.

භාෂා පරිවර්තන පාඨමාලාව:

I. දෙමළ - සිංහල පරිවර්තන පාඨමාලාව *(සිංහල සහ දෙමළ භාෂා දැනුම ඇති අපේක්ෂකයන්ට)*

II. ඉංග්‍රීසි - සිංහල පරිවර්තන පාඨමාලාව *(ඉංග්‍රීසි සහ සිංහල භාෂා දැනුම ඇති අපේක්ෂකයන්ට)*

**පාඨමාලාවේ කාලය:** අධ්‍යයන වර්ෂ එකකි. සෙනසුරාදා දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා දේශන පැවැත්වේ. *(රටෙහි පවතින වසංගත තත්වය හේතුවෙන් දේශන අවස්ථානුකූලව මාර්ගගත ක්‍රමයට **(online)** සහ පන්තිකාමර දේශන වශයෙන් ද කැලණිය විශ්වවිද්‍යාලයේ දී පැවැත්වෙනු ඇත.)*

**පාඨමාලා ගාස්තුව:** රු. 60,000/ කි. (රුපියල් හැට දහසකි) *(පළමු වැනි වාරිකය රු. 35,000.00ක් ඇතුළත් වීමේ දී හා දෙවැනි වාරිකය රු. 25,000.00ක් මුල් මාස තුන ඇතුළත ගෙවිය යුතු ය.)*

**අයදුම් කිරීම සඳහා අවම සුදුසුකම්:** අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් සමත්වීම හෝ ඊ හා සමාන සුදුසුකම් හෝ සේවා අවශ්‍යතාව මත වසර 10ක සේවා පළපුරුද්ද

**පාඨමාලාවට තෝරා ගැනීම:** වාග්විද්‍යා අංශය මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම

**පාඨමාලාවේ ආරම්භය:** 2022 අගෝස්තු

**අයදුම්පත්‍ර ගාස්තුව:** "භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව - 2022 අයදුම්පත් ගාස්තුව" යනුවෙන් සඳහන් කොට කැලණිය විශ්වවිද්‍යාලයේ, අංක 055-1-001-1-0667549 දරන එකතු කිරීමේ ගිණුමට බැර වන පරිදි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු.750.00ක් ගෙවා රිසිට් පත ලබා ගත යුතුය.

**අයදුම්පත්‍ර ලබාගන්නා ආකාරය:** ***dtri@kln.ac.lk*** යන විද්‍යුත් ලිපිනයට ඔබගේ අයදුම්පත් ගාස්තුව ගෙවන ලද රිසිට් පතෙහි ස්කෑන් පිටපතක් **(Scanned copy)** එවූ විට එම විද්‍යුත් තැපැල් ලිපිනයට අප විසින් අයදුම්පත්‍රය හා ගූගල් පෝරමය එවනු ලැබේ.

**අයදුම්පත්‍ර යොමු කරන ආකාරය:** මාර්ගගත ක්‍රමයට **(Online)** සම්පූර්ණ කරන ලද ගූගල් පෝරමය **(google form) Submit** කළ යුතු වන අතර අයදුම්පත්‍රය බාගත කර **(download)** සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔබගේ 1. උප්පැන්න සහතිකයේ පිටපතක්, 2. ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, 3. උසස් පෙළ විභාග සහතිකයේ පිටපතක් සහ 4. මහජන බැංකුවට රු. 750.00 ක මුදල ගෙවා ලබා ගත් රිසිට් පත සමඟ අමුණා

2022. 06. 24 දින හෝ ඊට පෙර ලැබෙන සේ **සම්බන්ධීකාරක, භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව, වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, කවරයේ ඉහළ වම් කෙළවරේ **"භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය - 2022"** යනුවෙන් සඳහන් කළ යුතුය.

---

- *බඳවා ගනු ලබන විද්‍යාර්ථීන් සංඛ්‍යාව සීමාසහිත බැවින් අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය.*
- *අයදුම්පත් ලැබෙන අනුපිළිවෙළ මත ප්‍රමුඛතාව හිමි වේ.*
- *පාඨමාලාව සම්බන්ධයෙන් වැඩි විස්තර 0112 908786/ 0112 908793 දුරකථන මගින් ලබා ගත හැකිය.*

*ලේඛකාධිකාරී, කැලණිය විශ්වවිද්‍යාලය - 2022.05.14*